# සාහිත්‍ය මූලාශ්‍රයවලින් අනාවරණය වන ශ්‍රී ලංකාවේ පෙතිකඩ චිත්‍ර සම්ප්‍රදාය පිළිබඳව විමර්ශනයක්

ඩී.එම්.වී. විශාකා

පුරාවිද්‍යාව හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
disanayakavishaka@gmail.com

**මුඛ්‍ය පද** - පෙතිකඩ චිත්‍ර, සාහිත්‍ය මූලාශ්‍රය, විහාර, තාක්ෂණය

**හැඳින්වීම**

ලක්දිව සිතුවම් කලාවේ ආරම්භය ආදී මානව යුගය දක්වා දිවෙන බව දැනට සොයාගෙන ඇති ප්‍රාථමික ගුහා සිතුවම් අනුව පැහැදිලි වේ. එසේ ඇරඹෙන්නා වූ ශ්‍රී ලංකාවේ සිතුවම් කලාව අනුරාධපුර යුගය හා පොළොන්නරුව යුගය තුළ දී සම්භාව්‍ය කලාවක් ලෙස වර්ධනය වී දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පොළ හා කෝට්ටේ යන අවස්ථාවල දී යම් පසු බෑමකට ලක් වී ඇති බව හඳුනාගෙන ඇති අතර නැවතත් මහනුවර යුගයේ දී විහාරාශ්‍රිත කලාවක් ලෙස මෙරට සිතුවම් කලාවේ තාක්ෂණික පාර්ශ්වය කෙරෙහි අවධානය යොමු විය. පුරාතන ලාංකික චිත්‍ර කලාව තුළ බිතුසිතුවම් කලාව, පෙතිකඩ චිත්‍ර සම්ප්‍රදාය, මැටි බඳුන් පින්තාරුව, පුස්කොළ පොත් හා ඒවායෙහි කම්බ අලංකරණය වෙස් මුහුණු වර්ණාලේපනය යනාදි වශයෙන් විවිධ ප්‍රභේද ගණනාවක් ම දක්නට ලැබේ. පුරාණ චිත්‍ර ශිල්පීන් බිත්ති මත පමණක් නොව රෙදි මත ද සිතුවම් ඇඳි තාක්ෂණය දැන සිටි බවට ද තොරතුරු හමු වී ඇත. මේ ආශ්‍රිතව හමුවන පුරාවිද්‍යාත්මක සාධක විරල අතර සාහිත්‍ය මූලාශ්‍රවලින් එම අඩුව පුරවා ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවේ පෙතිකඩ සිතුවම් කලාව අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වාම පැවතියේ ද යන ගැටලුවට අදාළව සාහිත්‍ය මූලාශ්‍ර කිහිපයක් ආශ්‍රයෙන් විමර්ශනයට ලක්කොට ඇත. සාහිත්‍ය මූලාශ්‍ර වලින් අනාවරණ වන එම පෙතිකඩ සිතුවම් කලාව පිළිබඳව තොරතුරු විමසා බලා ඒ පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම, පෙතිකඩ සිතුවම් නිර්මාණය කිරීමේ මූලික පරමාර්ථ කවරේද? ඒ සඳහා නිශ්චිත සාධක පවතීද? යන්නත් පිළිබඳව විමසා බැලීම අරමුණු අතර වේ.

**ක්‍රමවේදය**

මෙම අධ්‍යයනය සඳහා ද්විතීයික මූලාශ්‍ර පරිශීලනය හා අන්තර්ජාලය හරහා පුවත්පත් ලිපි, පර්යේෂණ ලිපි ආදී ක්‍රම මඟින් දත්ත රැස් කර, එම දත්ත විශ්ලේෂණය කර ප්‍රතිඵල විමසා යෝජනා ඉදිරිපත් කිරීමේ ප්‍රවේශය භාවිතා කරීමට අපේක්ෂා කෙරේ.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

පෙතිකඩ චිත්‍ර යනු ඝන කපු රෙදි කඩක අඳින ලද විවිධ ප්‍රමාණයන්ගෙන් යුක්ත විය හැකි සිතුවම් ලෙස හැඳින්වේ (සෝමතිලක, 2004:289). අනුරාධපුර අවධියේ දී මෙරට දියුණු සිතුවම් තාක්ෂණයක් පැවති බවට සාධක එම අවධියේ දැනට ශේෂව ඇති සිතුවම් කොටස් තුළින් මනාව තහවුරු වේ. පුරාවිද්‍යාත්මක සාධක නොමැති වුවද ක්‍රි.පූ. 2 වන සියවසේ දී රෙදි මත සිතුවම් ඇඳීමේ ශිල්ප ක්‍රමයක් පැවති බව මහාවංශයේ ලෝවාමහාපාය ඉදි කිරීම පිළිබඳව සඳහන් විස්තරය මඟින් තහවුරු වී ඇත. එහි දී රහතන් වහන්සේලා අටනමක් දෙව්ලොවට ගොස් රත්හිරියල් උපයෝගී කරගෙන සැලසුමක් ඇඳ ඇති බව අතිශයෝක්තියෙන් දක්වා තිබුණ ද එම කාලය වන විට රෙදි මත ඇඳීමේ ශිල්ප තාක්ෂණය මෙරට ශිල්පීන් ප්‍රගුණ කර සිටි බව ඉන් අනුමාන කළ හැකිය. එසේ ම රුවන්වැලි සෑය ඉදි කිරීමේ දී වැඩ නිම නොකළ කොටසේ රෙදිවලින් ආවරණය කොට සිතුවම් කළ බව ද මහාවංශයේ දැක්වේ. තවද චීන ජාතික පාහියන් භික්ෂුවගේ වාර්තාවේ සඳහන් පරිදි අභයගිරි විහාරය හා සම්බන්ධ දන්ත ධාතු ප්‍රදර්ශනයේ දී මඟ දෙපස තබා තිබූ රෙදිවල අඳින ලද

ජාතක කතා සහිත චිත්‍ර පුවරු ගණනාවක්ම උන්වහන්සේ දැක ඇති බවට සඳහන් වේ (එම: 289).

රෙදි මත ඇඳි සිතුවම් ඉක්මනින් දිරාපත් වන බැවින් එම සිතුවම්වල පුරාවිද්‍යාත්මක සාධක හමු වී නොමැත. පොළොන්නරු යුගයේ දී මෙම සිතුවම් පිළිබඳව එකල රචනා කරන ලද සසදාවත හා බුත්සරණ වැනි කෘතිවල සඳහන් තොරතුරුවලින් පැහැදිලි වේ. පොළොන්නරු යුගයේ දී ගඩොල් බිත්ති හා ගල් පර්වතවල පමණක් නොව අනුරාධපුර යුගයේ දී ඇරඹුණු පෙතිකඩ චිත්‍ර සම්ප්‍රදාය ද, එනම් එම තාක්ෂණය ද පැවති බවට සාහිත්‍ය මූලාශ්‍රය තුළින් සාධක ලැබී ඇත. මීට පසුව පොළොන්නරු රාජධානි සමයේ දීත් පෙතිකඩ සිත්තම් ක්‍රමය භාවිතයේ පැවති බව එකල රචනා කරන ලදැයි සැලකෙන සසදාවතේ එන (මුනිදාස, 1954: 20) 'මෙදා බඳ අලෙවි පටැ වැටි සැනෙව් දක්වා' යන පැදියෙන් ද සනාථ වේ. එම යුගයේ දී ම ලියැවුණු බුත්සරණයේ ද මේ පිළිබඳව සඳහන් වේ. මීට අමතරව දඹදෙණි යුගයේ දී රජ කළ තුන්වන විජයබාහු රජුගේ කාලයේ දී දළදා පූජවක් සඳහා මාර්ගයක් තනවා ඒ දෙපස ධජ පතාක හා පුන්කලස් ආදියෙන් සැරසිලි කොට එහි රජ තොරණ් හා පට තොරණක් කරවන ලද බව චූලවංශයෙහි (සෝමතිලක, 2004:.291) දක්වා ඇත. මෙහි සඳහන් පට තොරණ පෙතිකඩ චිත්‍රවලින් සරසන ලද එකක් බවද කියවේ. දෙවන පරාක්‍රමබාහු රජ කළ ද ජීවමාන බුදුන් වහන්සේ වැනි බුද්ධ රූපයක් පට රෙද්දක චිත්‍ර ශිල්පීන් ලවා ඇන්ද වූ බව චූලවංශයේ සඳහන් වී ඇත. මෙම යුගයේ ම පූජාවලියේ හා සද්ධර්මරත්නාවලියේ ද පෙතිකඩ චිත්‍ර පිළිබඳව කරුණු සඳහන් වේ (එම: 291). මින් අනතුරුව කෝට්ටේ රාජධානි සමයේ දී රචිත ග්‍රන්ථයක් ලෙසට සැලකෙන ගිරා සන්දේශයේත් මහනුවර සමයේ දී පමණ ලියැවුණු පුරාණ තුන්සරණය පොතෙහිද "නිතර මුණි ගුණදම් කියන්ටයි - විතර උසට පෙති පිළිම කරන්ටයි" යන සඳහනකින් හා "අන්දා පෙති පිළිමත් කරවන්ටයි - මන්දාතු රජු මෙන් උපදින්ටයි" යනුවෙන් ඇතුළත් වී තිබෙන විස්තරයේ පෙතිකඩ චිත්‍ර කලාව පිළිබඳව දක්වා ඇත. මේ කෙටි විස්තරයට අනුව අතීතයේ සිට ම මහනුවර යුගය දක්වා ම මෙරට පෙතිකඩ චිත්‍ර කලාව ඉතා හොඳින් අඛණ්ඩ ලෙස භාවිතයේ පැවති බව පැහැදිලි වේ. නමුත් මෙම තොරතුරුවලට අනුව මෙම පෙතිකඩ චිත්‍ර ඇඳීමට කවර හේතුවක් මුල් වූයේ ද යන්න පැරණි සාහිත්‍ය මූලාශ්‍ර වල පවා පැහැදිලි තොරතුරු නොමැත. ඒ කෙසේ වෙතත් මේ පිළිබඳව මතවාද 4ක් ඉදිරිපත් වී ඇත.

- වියනක් ලෙස භාවිතයට ගැනීමට.
- පෙරහැරවල දී රැගෙන යාමට.
- විහාර ගෙයක චිත්‍ර ඇඳීමට පෙර එය සැලසුම ලෙසට භාවිතා කිරීමට.
- ඒවයේ පවත්නා ආගමික ඇදහිලි නිසා විහාර දේවාලවල තිර වශයෙන් භාවිතා කිරීම.

යනුවෙනි. එහෙත් මේ අදහස් කිහිපයක්ම සත්‍ය බව සනාථ කරන පැහැදිලි සාක්ෂි කිසිවක් හෝ නොවන බැවින් මෙම සිතුවම් කවර අරමුණක් සඳහා නිර්මාණය කරන්නට ඇද්දැයි විමර්ශනය කිරීම වැදගත්ය (සෝමතිලක, 2004: 292-293). පොළොන්නරු යුගයෙන් පසු ඇති වූ අස්ථාවර දේශපාලන තත්ත්වය නිසා එකල අත්‍යවශ්‍ය බෞද්ධගමික කටයුතු ඉටු කිරීම සඳහා මෙබඳු පෙතිකඩ චිත්‍ර භාවිතයට ගැනීම වඩාත් පුළුල් වන්නට ඇත. එම නිසාවෙන් පෙතිකඩ චිත්‍රවල මූලික පරමාර්ථය වන්නට ඇත්තේ ද ආගමික කතා පුවතක් චිත්‍රණය කොට ඒවා නරඹන සැදැහැවතුන් තුළ ආගමික භක්තිය ජනනය කිරීම බව පැහැදිලිය.

**ආශ්‍රිත මූලාශ්‍රය**

***සසදාවත,*** (1954) සංස්. මුනිදාස කේ., කොළඹ, ගුණසේන සමාගම.
***පුරාණ තුන්සරණය***, සංස්. කොළඹ, ගුණසේන සමාගම.
සෝමතිලක, එම්., (2004), ***පුරාතන ශ්‍රී ලංකාවේ චිත්‍ර කලාව,*** කොළඹ, එස් ගොඩගේ සහ සහෝදරයෝ